# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2015 දෙසැම්බර් මස 11 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2015. 12. 14 දින නිකුත් කරන ලදී)**


# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.**

අග්‍රාමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)

එල්. ඩී. — ඕ. 50/2015.

### (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2015 අංක      දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

262 වන අධිකාරයට 27ඊ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**2.** (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 27ඉ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 27ඊ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"මුළු සභිකයින් සංඛ්‍යාව වැඩි කිරීම.

27ඊ. (1) (252 වන අධිකාරය වූ) මහනගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ (255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන පරිදි එක් එක් පළාත් පාලන ආයතනයේ මුළු සභිකයින් සංඛ්‍යාව ඒ මුළු සභික සංඛ්‍යාවෙන් තුනෙන් එකකින් තවදුරටත් වැඩි කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මුළු සභිකයන් සංඛ්‍යාවෙන් හතරෙන් එකක් සංයුක්ත වන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාග සංඛ්‍යාවක් වන අවස්ථාවක දී, එම මුළු සභිකයන් සංඛ්‍යාවෙන් හතරෙන් එක සංයුක්ත වන සංඛ්‍යාව ලෙස එම පූර්ණ සංඛ්‍යාව සළකනු ලැබිය යුතු ය.

2—PL 009501 -425 (2015/12)

(2) මේ ආඥාපනතේ 3ඇ වන වගන්තිය යටතේ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නිශ්චය කරන ලද පරිදි (1) වන උපවගන්තිය යටතේ එසේ වැඩි කරන ලද සංඛ්‍යාව, ඡන්ද විමසීමක දී තරග කරන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ (මෙහි මින්මතු "ස්වාධීන කණ්ඩායම" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් කණ්ඩායමක් හෝ විසින් ඉදිරිපත් කරනු ලබන කාන්තා අපේක්ෂිකාවන්ගේ ලැයිස්තුව සංයුක්ත කරනු ලැබිය යුතු ය".

(3) (1) වන උපවගන්තිය යටතේ එසේ වැඩි කරන ලද සංඛ්‍යාව අමාත්‍යවරයා විසින් කරනු ලබන නියමයක් මගින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "(මෙහි මින්මතු "ස්වාධීන කණ්ඩායම" ලෙස හඳුන්වනු ලබන), යම් පිළිගත් දේශපාලන පක්ෂයක්" යන වචනවල සිට "ආකෘතියට සාරානුකූල වූ ආකෘතියකින්-", යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"යම් පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත්කර ගැනීමේ කාර්යය සඳහා සහ එම පළාත් පාලන ආයතනයේ කාන්තා සභිකයින් තෝරාගනු ලැබීමේ කාර්යය සඳහා යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් එම පළාත් පාලන ආයතනයේ සියලු කොට්ඨාශ සම්බන්ධයෙන්, අපේක්ෂකයන්ගේ ලැයිස්තු ඇතුළත් නාම යෝජනා පත්‍ර දෙකක් ඉදිරිපත් කළ යුතු ය. එම පළාත් පාලන ආයතනයේ සියලු

කොට්ඨාශ සම්බන්ධයෙන් එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය විසින් හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා පත්‍ර දෙකෙන් එක් නාම යෝජනා පත්‍රයක්, එම පළාත් පාලන ආයතනයේ සභිකයින් ලෙස තෝරා පත් කරගැනීමේ කාර්යය සඳහා වූ ද, පළමුවන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ද, පහත සඳහන් ලෙස නම් දක්වා ඇති අපේක්ෂකයන්ගේ නම් ලැයිස්තුවකින් සමන්විත විය යුතු ය:—";

(2) එම වගන්තියේ (2අ), (2ආ) සහ (2ඇ) යන උපවගන්ති පිළිවෙලින් එම වගන්තියේ (2ඇ), (2ඈ) සහ (2ඉ) වශයෙන් නැවත අංක යෙදීමෙන් ;

(3) එම වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම පහත සඳහන් (2අ) වන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2අ) යම් පළාත් පාලන ආයතනයක සියලු කොට්ඨාශ සම්බන්ධයෙන් වූ මේ වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් අනෙක් නාම යෝජනා පත්‍රය, ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව සකස් කරනු ලැබුවා වූ කාන්තා අපේක්ෂාවන් සංඛ්‍යාවකගේ ලැයිස්තුවකින් සමන්විත විය යුතු ය.";

(4) එම (2) වන උපවගන්තියේ අතුරු විධානයට ඉක්බිතිව ම ඇති ඡේදය (2ආ) ලෙස අංක යෙදීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 65අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 65අඅ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:— ප්‍රධාන ප්‍රඥප්තියට 65අඅ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"තෝරා ගනු ලැබිය යුතු කාන්තා සභිකයින් ප්‍රකාශයට පත් කිරීම.

65අඅ. (1) එම පළාත් පාලන ආයතන ප්‍රදේශයේ සියලු කොට්ඨාශවලින් තෝරාගනු ලැබිය යුතු කාන්තා සභිකයන් සංඛ්‍යාව ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව පිළිගත් දේශපාලන පක්ෂ අතර සහ ස්වාධීන

කණ්ඩායම් අතර බෙදා වෙන් කිරීමේ දී මැතිවරණ කොමසාරිස්වරයා විසින්, එම පළාත් පාලන ආයතනයේ සියලු කොට්ඨාශවල දී එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ලබාගත් වලංගු ඡන්ද සංඛ්‍යාව සැළකිල්ලට ගත යුතු අතර, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාවේ දක්වා ඇති ක්‍රමය අවශ්‍ය වෙනස් කිරීම් සහිතව යොදා ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(අ) පළාත් පාලන ආයතනයේ සභිකයින් වශයෙන් තෝරාපත් කර ගනු ලැබූ හෝ තෝරා ගනු ලැබූ සහ 28 වන වගන්තියේ (2අ) උපවගන්තියේ සඳහන් වන පරිදි තෝරා ගනු ලැබූ කාන්තා අපේක්ෂිකාවන්ගේ නම් නිශ්චිතව සඳහන් කරමින් දැන්වීමක් පළ කරනු ලැබිය යුතු ය ; සහ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66අ වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එහි ඇති (ආ) ඡේදයේ "ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය." යන වචන වෙනුවට "ස්වාධීන කණ්ඩායමේ නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය; හෝ"; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඇ) මේ ආඥාපනතේ 65අඅ වන වගන්තිය යටතේ තෝරා ගනු ලැබූ කාන්තා සභිකයකු සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි, අදාළ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන

කණ්ඩායමේ ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව සකස් කරනු ලැබූවා වූ ලැයිස්තුවේ ඊලඟට නම තිබෙන කාන්තා අපේක්ෂිකාව පුරප්පාඩු ඇති වී දවස් තිහක් ඇතුළත නාමයෝජනා කළ යුතු ය.”

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.